
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 118/ News/ 2011

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 ජනවාරි 02 සඳුදා
04 වෙළුම - 10 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00





ඡායා : තිළිණ අලහකෝන්

## දෙවිඳුන් හා පෙමින් බැඳී – නව වසරේ ළඟින් හිඳී
## කිතු දරුවන් ලෙසින් හැඳී – ලොවම දිනමු හෙට දින දී

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ක්‍රිස්තු වටිනාකම් වලින් පොහොසත් කරගත යුතු නව වසරේ ප්‍රාර්ථනා !

### ආදරණීය දුවේ පුතේ...

2012 නව වසරත් උදා වුණා. 2011 වසර ක්‍රමයෙන් ගෙවී ගියේ නත්තලේ මහත් වූ සාමයේ පණිවුඩය පුංචි ඔබගේ හදවත් වල ඉතාමත් ගැඹුරින් සටහන් කරමින් බව විශ්වාසයයි. වෙනදාටත් වඩා මෙවර නත්තල් උදාවත් සමග ශ්‍රී ලංකා දේශයේ මනුෂ්‍ය හදවත් වලට ඉතාමත් දැඩිව මේ සාමයේ හා මනුෂ්‍යත්වයේ පණිවුඩය ගැන කථා කරන ප්‍රායෝගික අවස්ථා බෙහෙවින්ම සමාජයේ දැක ගන්නට ඉඩ ප්‍රස්ථා උදා වී තිබුණ. පුංචි ඔබත් ජේසු සමිඳුන්ට ඉතාම ලගින් ඉන්නා කතෝලික දූ දරුවන් පිරිසක් බව සැමගේ විශ්වාසයයි. ඉතින්, ඒ නිසාම බිළිඳු ජේසු ගවලෙන තුළ බිහිවෙමින් මුළු මහත් ලෝකයටම ගෙන ආ සාමයේ හා සහෝදරත්වයේ පණිවුඩය පුංචි ඔබත් කුඩා ඔබේ හදවත් වල දාරණය කර ගත යුත්තේ උදාවූ මේ නව වසර තුළත් කිතුනු වටිනාකම් වලින්ම ඔබේ ආකල්ප සිතිවිලි පුරවා ගන්නටම නේද ? එය කෙසේවත් අමතක කළ යුතු නැහැ. නව වසර තුළ පරිසරය අළුත් වෙන කොට, පාසැල් පරිසරය අළුත් වෙනකොට අළුත් යහළුවන්, යෙහෙළියන් සමග අළුත් පංති කාමර වලට පිවිසෙන කොට කතෝලික විශ්වාසය තුළ ඔබත් ජීවිතයේ රෝපණය කර තිබෙන මිනිස් වටිනාකම් තව තවත් කිතුනු වටිනාකම් වලින් පුරවා ගන්නට අවශ්‍යයි. එය කළ යුත්තක්මයි.

කිතුනු වටිනාකම් සම්පූර්ණයෙන්ම ගැබ් වී තිබෙන්නේ බයිබලීය වටිනාකම් තුළයි. සුබාරංචි වටිනාකම් තුළයි. ජේසු සමිඳුන්ගේ කන්ද උඩ දේශනාව පුංචි ඔබේ ජීවිත වලට මේ වටිනාකම් කවා ලන්නට හා රෝපණය කරන්නට ලබා දෙන්නේ ඉතාම වටිනා පසුබිමක්. එය අමතක කරන්න එපා. කුඩා කළ සිටම ජේසු සමිඳුන්ගේ වචනයේ බලය ඔස්සේ ජීවිත ශක්තිමත් කරන විට ඔවුන් වහන්සේ කන්ද උඩ දේශනාවේදී මතක් කළ දේව රාජ්‍යයේ වටිනාකම් සැවොම ජීවත් වන මේ මහා පොළව මතම අත් දකින්නට හා ජීවත් කරවන්නට අපි උත්සාහ ගත යුතුයි.

ඉතින් දුවේ පුතේ, 2011 වසරේ නත්තල උදාවත් සමගම ඔබ ඔබේ දෙමව්පියන් සමග පුංචි ගවලෙන වෙතට ගිහිල්ලා ජීවිත අළුත් තීරණ ගත්තා මතකයි නේද ? ජීවිතයේ වැරදි අඩුපාඩුකම් හදා ගනිමින් වැරැද්ද පිටු දකිමින් හරි දෙයට හරියි කියමින් හොඳ දෙයට හොඳයි කියමින් නිර්භීත කිතුනු දැක්මක් ඇතිව නරක හා වැරදි දෙය ක්‍රමානුකූලව ජීවිතයේ ක්‍රියාවලින් හා සිතිවිලි වලින් ඉවත් කරනවායි කියන ගැඹුරු එලෙසම ස්ථිරසාර තීරණ, නිගමන වලට ඔබ ජීවිතයේ විවෘත භාවයක් ඇති කර ගත්තා නේද ? දැන් නව වසර තුළ එම තීරණ ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ගත් ගැඹුරු ජීවිත තීරණය නව වසර තුළදී ඔබේ කිතුනු ජීවිතයේ ප්‍රායෝගිකව එළි දක්වන්නට සාමූහිකත්වයක් ඔබ අන් අය සමගත් ඇති කර ගත යුතුයි. මෙය තනිව ඉටු කළ හැකි කාර්යයක් නොවේ. මෙය ආත්මාර්ථය ජීවිතයේ ඉලක්කය බවට පත් කර ගත් අයට කළ හැකි ක්‍රියාවක් ද නොවේ. මුලින්ම පරාර්ථකාමී සිතිවිල්ලක් ඔබ ජීවිතයේ ඇති කර ගත යුතුයි. සහෝදරත්වයේ මඟක් ඔබ ජීවිතයේ හෙළි පෙහෙළි කර ගන්නට උත්සාහ කළ යුතුයි. ඒ පමණක් නොවේ. තමන් ගැන මෙන්ම අන් අය ගැනත් ඒ සිතිවිල්ලෙන්ම කල්පනා කළ යුතුයි. යහපත නිරතුරුවම ඉටු කරන්නට ඉටා ගත යුතුයි. මේ සියළු දෑ කිතුනු වටිනාකම් හා ශුභාරංචි වටිනාකම්.

නව වසරකදී ජීවිතය බාහිර වශයෙන් අලුත් කර ගන්නවා වගේම ජීවිත අභ්‍යන්තරයත් අළුත් කර ගන්නට ඔබ උත්සාහ කරන බව ඉතාම පැහැදිලියි. පුංචි දුවේ, පුතේ ඔබේ ජීවිතය දෙමාපියන් නෑ හිතමිතුරන්ට වගේම කතෝලික සභාව තුළ ජීවත් වන හැම කෙනෙකුටම වටිනවා. ඒ වටිනා ජීවිතය ජීවත් වන සමාජයට ඔප් නැංවූ මැණිකක් සේ දායාද කරන්නට ඔබට පූර්ණ ශක්තිය ලැබෙන්නේ විශ්වාසයේ කිතුනු වටිනාකම් තුළින්මයි. ඒ නිසා මේ නව වසරේ ඔබේ අළුත් ප්‍රාර්ථනා හා සිතැගින් කිතුනු වටිනාකම් වලින්ම පොහොසත් කර ගන්න. සාමයේ කුමරුන් වූ ජේසු සමිඳුන්ගේ ආශිර්වාද අප ඔබට හද පත්ලෙන්ම ප්‍රාර්ථනා කරනවා.

උදාවූ නව වසර පුංචි ඔබට කිතුනු වටිනාකම් තුළින් ජීවිතය ආලෝකමත් කරන්නට වරම් ලැබේවා. සෞභාග්‍යමත් නව වසරක් වේවා.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

**අද සමාජය දෙස බැලීමේ දී දරුවාට "ආදරය" යන්න ලැබීම ඉතා අල්පය. අදාරය නොලද දරුවා අකීකරු ගතිපැවතුම් අත්තෙකි. දරුවාව අගය කළ යුතුය. අගය නොකරන දරුවා කිසි කළෙක වැඩිහිටියන් ගුරුවරුන් අගය නොකරයි. සමාජයේ ජීවත් වීමේ වගකීම තුළ කාලයේ සිරගතව සිටින දෙමාපියන්ගෙන් නොලබන ආදරය, අඩු වශයෙන් දහම් ගුරුවරයාවත් සපුරාලිය යුතුය. දරුවාට ආදරයෙන් කතා කිරීමට දරුවා අගය කිරීමට වැඩිහිටි අප සියලු දෙනාගේම යුතුකමක් බව අමතක නොකළ යුතුය. විශේෂයෙන් නිවසේ පිළිගැනීමක් නොලබන දරුවාට දහම් පාසල ආදරයේ තෝතැන්නක් කළ හැකි වන්නේ දහම් ගුරුවරයාටය.**

# දහම් ගුරුවරයා සහ දරුවා

**මාලිනි හපුආරච්චි,**
**පාතිමා දහම් පාසල**
**දිප්පිටිගොඩ,**
**දළුගම මීසම**


මුල් මිනිසාගේ පාපය නිසා පිරිහුණු සමාජය නගා සිටුවීම සඳහා දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් අප වෙත එවූ සේක. ඒ උන්වහන්සේ මිනිසාට දැක්වූ අසීමිත ප්‍රේමයයි. ජේසුස් වහන්සේ ප්‍රේමයේ සංකේතය යි. මිනිසාගේ දුර්වලකම් තේරුම් ගෙන සමාජයට බිහිවන දරුවන්ගේ ශාරීරික, මානසික, අධ්‍යාත්මික වර්ධනය සඳහා මව් - පිය - ගුරු යන තිදෙනෙක් උන්වහන්සේ අපට දානය කළ සේක.

මිනිසාගේ මුල් පාපයෙන් දරුවාට අහිමි වූ පිරිපුන් බව ලබා ගැනීමට දෙවියන් වහන්සේ මෙම කැඳවීම ලබා දී දහම් ගුරුවරයා කැඳවා ඇත. දහම් ගුරුවරයා උත්ථාන වූ ජේසුස් වහන්සේ දරුවන්ට හඳුන්වා දීමේ අපෝස්තලික දූත මෙහෙවරේ ප්‍රබල දායකත්වය ලබන්නෙකි. දෙවියන් වහන්සේ නියෝජනය කරන මේ උතුම් කැඳවීම, පිළිගැනීම සමාජයේ දරුවන් වෙනුවෙන් කාලය, ශ්‍රමය වැය කිරීම දෙවියන් වහන්සේගේ ආදරය අප වෙත ලබා ගැනීමකි. උන්වහන්සේට කෘතඥ වීමකි. " මෙසේ ඔබ ස්වර්ගයෙහි වැඩ සිටින ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නාහුය. කුමක් නිසාද උන්වහන්සේ දුදනුන් හට අදමිටුවන් හට තම හිරු එළිය උදා කරවන සේක." ( මතෙව් 5: 45)

දහම් ගුරුවරයා සත්‍යවාදී විය යුතුය. කිසිවිටකත් අසත්‍ය දේ කතා නොකරයි. නිවැරදි දේ පමණක් ක්‍රියාවේ නැංවිය යුතුය. අයුක්තියෙන් බැහැර විය යුතුය." මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි" (ජුවාම් 14: 6) මිනිස් ජීවිතයේ වටිනාකම් අවබෝධ කරගෙන අන්‍යයන් විචේචනාත්මක හෙළා දැකීම් වලින් තොරව තම ජීවිතයෙන් සහ අවවාද වලින් ජීවත් කරවිය යුතුය. පොතට පතට සීමා වූ ජීවිතයට සම්බන්ධකමක් නැති දැනීමක් නොව දැනීම් හා අත්දැකීම් තුළින් කෙනෙකු ලබන ප්‍රායෝගික දැනුමෙන් දහම් ගුරුවරයා පෝෂණය විය යුතුය. "ප්‍රේමය" යනු පරිත්‍යාගයකි. හොඳ ගුරුවරයෙක් සිසුන්ගේ ජීවිත සාර්ථකත්වයට පත් කිරීමට මග පෙන්වන්නෙක් විය යුතුය.




දහම් ගුරුවරයා දරුවා අතර මාංශගතවීම ඉතා අවශ්‍ය වෙයි. දරුවා තුළට ඇතුල්වීමෙන් ඔවුන්ගේ සිතුම් පැතුම් සොයා බැලීමෙන් දරුවා තුළ මානව ආකල්ප ගොඩ නැංවාලීය හැකිය.



දහම් ගුරුවරයා දරුවාට පියෙකි. මවකි. පැය 1 1/2 කට පමණක් සීමාවූ පියෙක්, මවක් නොව පැය 24 ම දරුවාට පියෙක් මවක් විය යුතුය. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව "ළදරුවන්ට මා වෙතට එන්න ඉඩ හරින්න. ඔවුන් නොවළක්වන්න. මන්ද ස්වර්ග රාජ්‍යය මෙවැන්නන්ගේ යයි" වදාළ සේක. (මතෙව් 19 : 14 )

අද සමාජය දෙස බැලීමේ දී දරුවාට "ආදරය" යන්න ලැබීම ඉතා අල්පය. අදාරය නොලද දරුවා අකීකරු ගතිපැවතුම් අත්තෙකි. දරුවාව අගය කළ යුතුය. අගය නොකරන දරුවා කිසි කළෙක වැඩිහිටියන් ගුරුවරුන් අගය නොකරයි. සමාජයේ ජීවත් වීමේ වගකීම තුළ කාලයේ සිරගතව සිටින දෙමාපියන්ගෙන් නොලබන ආදරය, අඩු වශයෙන් දහම් ගුරුවරයාවත් සපුරාලිය යුතුය. දරුවාට ආදරයෙන් කතා කිරීමට දරුවා අගය කිරීමට වැඩිහිටි අප සියලු දෙනාගේම යුතුකමක් බව අමතක නොකළ යුතුය.

**ඉතිරිය 14 පිටුවේ...**

# කිරිඳි පිළිබඳ උපමාව තේරුම් ගනිමු




ආදර නංගි මල්ලි, ඔයාලා දන්නවා ජේසු සමිඳුන් උන්වහන්සේගේ ජනතාවට විවිධ මාර්ගවලින් සුබ වදන කියලා දුන්න බව. දේශනා, ප්‍රාතිහාර්ය, විවිධ සුවකිරීම් මෙන්ම උන්වහන්සේගේම හැසිරීම යන මේ හැම දෙයක් තුළින්ම අපට පෙන්වා දුන්නේ දෙවිඳුන්ට ප්‍රසන්න විදිහට අපි ජීවත් වෙන්නේ කොහොමද කියලා. මෙම විවිධ ඉගැන්වීම් ක්‍රම අතරින් උන්වහන්සේගේ දේශනා ගැන අපි අවධානය යොමු කළහොත්, ඒ තුළ වන උපමා උපමේයයන් අපිට වඩාත් හොඳින් කැපිලා පේනවා.

සාහිත්‍ය, සිංහල භාෂාව ඉගන ගන්න පුංචි ඔයාලා දන්නවා, ලේඛනයේ දී... දේශනවලදී සාමාන්‍ය කතාබහේ දී... ඇයි අපි උපමා උපමේයයන් භාවිතා කරන්නේ කියලා. සරලවම තියනව නම් අපි ප්‍රකාශ කරන දේ වඩාත් හොඳින් තේරුම කිරීමට උපමා උපමේයන් භාවිතා කරනවා. ජේසු සමිඳුන්, උන්වහන්සේගේ ඉගැන්වීම් වල මේ උපමා උපමේයයන් බොහොමයක් භාවිතා කරලා තියෙනවා.

උන්වහන්සේ වටා එකතු වුණු ජනතාව විවිධ සමාජ තල වලට, විවිධ වයස් සීමාවන්ට අයත් වුවන්. ඒ නිසා උන්වහන්සේ ඉගැන්වූ දේව පණිවුඩය වඩා හොඳින් හැමෝටම තේරුම් ගැනිමට හැකිවන ආකාරයෙන් පැවසීමට උන්වහන්සේ තම දේශනාවල දී උපමා උපමේයයන් භාවිතා කළා. දැන් අපි මේ සුදානම් වෙන්නේ එතුමා වදාළ එවැනි එක් උපමාවක් කෙරේ අපගේ විශේෂ අවධානය යොමු කිරීමට යි.

නංගි මල්ලි, ඔයාලා අහල තියෙනවද "කිරිඳි" පිළිබඳ උපමාව ශු. මතවේ තුමාගේ සුවිශේෂයේ දහතුන්වන පරිච්ඡේදයේ තමයි ඒක සඳහන් වෙන්නේ. (13:



24 - 30) මේ උපමාව ගැන කෙටියෙන් විස්තර කළහොත් එක් වතුපාලකයෙක් තමන්ගේ වගා භූමියේ "තිරිඟු" ඇට වපුරනවා. නමුත් එම වතු හිමියා නිදා ඉන්න වෙලාවක ඔහුගේ සතුරෙක් ඇවිල්ලා එම භූමියේම කිරිඳි නැමති පලක් නැති බීජ වැපුරුවා. තිරිඟු ඇට පැල වෙලා කරල් හැදෙන කාලේට කිරිඳි ගසුත් වර්ධනය වෙලා ආවා. මේක දැකපු වතු සේවකයෝ තම ස්වාමියාගෙන් මෙහෙම විමසුවා..." ඔබ හොඳ තිරිඟු බීජ වැපුරුවා නේද ? නමුත් කොහොමද කිරිඳි පැළවුණේ.."

එවිට ස්වාමියා පැවසුවේ එය තමන්ගේ සතුරෙකුගේ වැඩක් බව. වැඩකට නැති එම කිරිඳි පැල උදුරා දමන්න සුදානම් වුන දාසයන් ට ඔහු පැවසුවේ " ඔබලා කිරිඳි උදුරද්දී හොඳ තිරිඟු ගසුත් ඒ සමඟ ඉදිරෙන්න පුළුවන්න. ඒ නිසා දැන්ම ගලවන්න එපා. අස්වැන්න කපන කාලයේදී කිරිඳි ගස් උදුරලා පුච්චන්න මිටි බදින්න. තිරිඟු ටික මාගේ අටුවේ රැස් කරන්න." කියලා.

ඉතින් නංගි මල්ලි මේ උපමාව මගින් ජේසුස් සමිඳුන් අපිට මොනවද කියන්නේ කියලා ඔයාලට හිතන්න පුළුවන් ද ? මේ උපමාවේ වතු හිමියා සමාන වෙන්නේ ජේසු සමිඳුන්ටයි. තිරිඟු වපුරපු භූමිය කියන්නේ මේ ලෝකයටයි. ජේසු සමිඳුන්ට මේ ලෝකය තුළ යහපතේ බීජ වපුරුවා. දේව වචන අසා ඒ අනුව ජීවත් වෙන අය තමයි තිරිඟු. උන්වහන්සේ කිරිඳි වලට සමාන කරන්නේ අයහපත තුළ දිවි ගෙවන අයයි. උයනේ සේවකයෝ තමයි දේව දූතයෝ. අවසාන විනිශ්චය දවසේ දී දේව වචනය අහලා ජීවත් වුනු අයට ස්වර්ග රාජ්‍යයට ඇතුළු වෙන්න පුළුවන් වෙනවා. නමුත් අයහපත තුළ දිවි ගෙවපු අයට සිදුවන දේ තමයි කිරිඳි වලින් පෙන්නුම් කලේ.

මේ උපමාවේ ඉතාමත් ලස්සනම අවස්ථාවක් තමයි උයනේ සේවකයා ඇවිල්ලා කිරිඳි පැල ගලවන්න හදද්දී එසේ නොකරන්න කියලා ස්වාමියා කියන අවස්ථාව. මොකද තිරිඟු පැල ඒ වනවිට ගැඹුරට මුල් ඇදලා ශක්තිමත්ව වැඩිලා තිබුනේ නැ. ඒ වෙලාවේ කිරිඳි පැල ගැලවුවහොත් ඒ එක්ක තිරිඟු පැලත් ගැලවිලා යන්න පුළුවන්. මේ තුළ තියෙන පණිවුඩය නම් හරිම ගැඹුරු වගේම අපේ ජීවිතයට හරිම ප්‍රායෝගිකයි කියලා හිතෙන්නේ නැද්ද ..? අපි යහපත තුළ ස්ථිර වෙලා හිටියේ නැත්නම් වැරදි දේ වලට අපිව ඉක්මනට පෙළඹෙනවා. ඒක නිසා දේව වචනය තුළ, යාච්ඤාව තුළ ගැඹුරට යමින් අපේ ජීවිතේ ශක්තිමත්ව ගොඩනගා ගන්න ඕනේ. එතකොට කිසිම පාපයේ බලවේගයකට අපිව වෙනස් කරන්න බෑ.

ඉතින් නංගි මල්ලි, මේ උපමාව ශු. බයිබලය තුලින් හොයලා තව සැරයක් කියවලා බලන්න. එතකොට මේ උපමාවේ පණිවිඩුය තවත් ගැඹුරින් තේරුම් ගන්න පුළුවන් වේවි. ඒ ආලෝකයෙන් මේ උපමාව ගැන එහි අර්ථය ගැන පාසලේ දී, පංතියේ දී හමුවන පුංචි ඔයාලගේ යාළුවන්ටත් කියලා දෙන්න. එතකොට ඔයාලාත් පුංචි ධර්මදූතයෙක් වෙනවා.

**ජේසු පිහිටයි.**

# විශ්වාසයෙන් දිවිගෙවා දේව බලය අත්දකිමු


ජාකොබ්ගේ විශ්වාසයේ ගමන මෙනෙහි කළ ඔබ, අද සිට ජෝශප්, දෙවිඳුන් හා විශ්වාසයෙන් ගමන් කළ අයුරු පිළිබඳව බලමු.

ජෝශප් ජාකොබ්ගේ බාල පුතෙකි. ජෝශප්ගේ ජීවිත ගමන තුළ දෙවිඳාණෝ පුදුමාකාර ලෙස ගමන් කළේය. ඒ ගමන ඉතාමත් කටුකය. දුෂ්කරය, ඔහුට බොහෝ දුක් පීඩා විඳින්නට සිදු විය. නමුත් අවසානයේ දී ජෝශප් මිසර දේශයේ අධිපති බවට පත්වේ.

තම සහෝදරයන් විසින් ජෝශප්ව මරන්නට තීරණය කළත් ඔහුට වද දී ළිඳකට දමා, පසුව මිසර වැසියන්ට වහලකු ලෙස විකුණන ලදී. දෙවිඳාණෝ ඔහුට සිහින තේරීමේ විශේෂ හැකියාවක් දී තිබිණි. පාරාවෝ රජුගේ මුරසෙන්පතිගේ භාර්යාව කළ අයුතු යෝජනාවට එකඟ නොවීම නිසා, බොරු චෝදනාවකට ලක් කර ජෝශප්ව සිරයට යැවීය. මෙම සිරගත වීම දේව සැලැස්මක් ම විය. මන්ද සිරගෙය තුළ දී සිරකරුවන්ගේ සිහින තෝරා දී ඔහු ප්‍රසිද්ධ වු බැවිනි. එහි ප්‍රතිඵලය වුයේ පාරාවෝගේ සිහින තෝරා දී ජෝශප් මිසර දේශාධිපති වීමයි.

ජෝශප් අත්විඳි දුක් ගැහැට එමටයි. නමුත් ඔහු දෙවිඳුන් හා ගැඹුරින් සම්බන්ධ වී සිටි නිසා සෑම අයහපතක් තුළින්ම දෙවිඳාණෝ ඔහුට යහපත සැලසු සේක. ඔහු මුහුණ දුන් සෑම සිදුවීමක් දෙසම විශ්වාසයෙන් බැලූ නිසා, සිදුවීම් තුල සැඟවී ක්‍රියා කරන දෙවිඳුන්ව හඳුනා ගන්නට හැකි විය.



ජෝශප් අත්විඳි දුක් ගැහැට එමටයි. නමුත් ඔහු දෙවිඳුන් හා ගැඹුරින් සම්බන්ධ වී සිටි නිසා සෑම අයහපතක් තුළින්ම දෙවිඳාණෝ ඔහුට යහපත සැලසු සේක. ඔහු මුහුණ දුන් සෑම සිදුවීමක් දෙසම විශ්වාසයෙන් බැලූ නිසා, සිදුවීම් තුල සැඟවී ක්‍රියා කරන දෙවිඳුන්ව හඳුනා ගන්නට හැකි විය. ඔහු කිසිවිටක අධෛර්යයට පත් නොවීය. ජීවිතය කලකිරුනේ නැත. තනි වුනේ ද නැත. ඔහු සමග දෙවිඳුන් ජීවමානව වැඩ සිටිම පුද්ගලික අත්දැකීමක් විය.

ආදර දරු දැරියන් මා අද ඔබ සමග පුංචි ක්‍රියාකාරකමක් කරන්නයි සූදානම් වන්නේ. පිටු 80 තනිරුල් පොතක් ගන්න. ඔබගේ ජීවිත කථාව එම පොතේ ලියන්න. ඒ මෙසේය. අවුරුදු 5 ක් ඇතුලත සිදුවු ඔබට මතක හැම දෙයක්ම ලියන්න. දෙමව්පියන්ගේ සහයෝගයව ද ගන්න. ඔබට මතක නම් දිනය, මාසය, වසර ලියන්න. උපතින් පටං ගන්න.

1. වයස 1-5 දක්වා
2. වයස 5-10 දක්වා
3. වයස 10-15 දක්වා
4. වයස 15-20 දක්වා

ඔබේ ජීවිත කථාව ලියන්නට පෙර ජෝශප්ගේ ජීවිත කථාව කියවන්න. (උත්පත්ති පොතේ 37-41 පරිච්ජේද දක්වා.)

ඔබගේ ජීවිතය තුළ දෙවි පියාණන් වහන්සේ ගමන් කරන අයුරු විශ්වාසයෙන් සොයා ගන්න. එසේ නැති නම් ඔබට විශ්වාසයේ ගමනක් යා නොහැකියි. ජේසුගේ බලගතු බලය අත්දැකිය නොහැකියි.

**ගරු ශිරෝමා ප්‍රනාන්දු**
**පැවිදි සොයුරිය.**



**මාසික සිතිවිල්ල**



මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, “දෙසැම්බර් මාසය”

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය විෂය හදාරණ සිසු දරු දැරියන් සියලුම දෙනා දැන ගත යුතු මූලික කරුණක් තිබේ. එනම්, 10-11 ශ්‍රේණි වල පෙළපොත් දෙකෙන් ආවරණය වන "සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය ප්‍රශ්න පත්‍රයට" මූලාශ්‍රය වන්නේ "කතෝලික සභා ධර්මෝපදේශය" නැමැති නව විශ්වවීය ධර්මෝපදේශ ග්‍රන්ථය බවයි.

කතෝලික සභා ධර්මෝපදේශය නමැති ග්‍රන්ථයේ ප්‍රධාන කොටස් 04, 10-11 ශ්‍රේණි කතෝලික ධර්මය පෙළපොතේ ප්‍රධාන තේමා 04 ට සමානය. ඒ බව පහත සටහන ඇසුරින් අවබෝධ කර ගන්න.

| කතෝලික සභා ධර්මෝපදේශය ප්‍රධාන කොටස් | 10-11 ශ්‍රේණි කතෝලික ධර්මය පෙළපොත - ප්‍රධාන තේමා |
|---|---|
| 1. විශ්වාසයේ ප්‍රකාශය | 1. දෙවියන් වහන්සේ පිළිබඳ නිසි අවබෝධය සහ නූතන ලෝකය තුළ දේව ක්‍රියාකාරිත්වය |
| 2. ක්‍රිස්තු අභිරහසේ උත්සව පැවැත්වීම | 2. දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු |
| 3. ක්‍රිස්තු තුමන් තුළ ජීවිතය | 3. දේව පනත් පිළිපදිමින් නීති ගරුකරන හා සදාචාර සම්පන්න ජීවිතය |
| 4. ක්‍රිස්තියානි යාච්ඤාව | 4. ක්‍රිස්තියානි යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙන දෙවි සමිඳාණන් සමග ගැඹුරුමය සම්බන්ධතා. |

කතෝලික සභා ධර්මෝපදේශය නමැති ග්‍රන්ථය අපගේ පෙළපොත් වලට මූලාශ්‍රය වී ඇති නිසා, එහි යටගියාව සොයා බැලීම වසර ආරම්භයේදී ඉතා වැදගත්ය.

දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියා විසින් 1992 ජුනි 25 වන දින නිල වශයෙන් කතෝලික සභා ධර්මෝපදේශය නමැති නව විශ්ව යීය ධර්මෝපදේශ ග්‍රන්ථය මුල් වරට අනුමත කරන ලදි.

මෙම ග්‍රන්ථය නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ 1992 ඔක්තෝබර් 11 වන දිනයි.

කතෝලික සභා ධර්මෝපදේශය ග්‍රන්ථය ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්විය හැකිය. ඒ එක් එක් කොටසේ අන්තර්ගතය (100%) කොපමණ දැයි අවබෝධ කර ගනිමු.

| කොටසේ නාමය | අන්තර්ගතය (100%) |
|---|---|
| • විශ්වාස ලක්ෂණය - සභාවේ විශ්වාසය | 39% |
| • ප්‍රසාද නිධාන - සභාවේ ජනවන්දනාව | 23% |
| • දස පනත - ක්‍රිස්තු තුමන් තුළ නව ජීවනය | 27% |
| • යාච්ඤාව - ක්‍රිස්තියානි යාච්ඤාව | 11% |

මෙම ග්‍රන්ථය දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් නිකුත් කරන ලද නිල ප්‍රකාශන 16 හි අඩංගු ඉගැන්වීම්. සරල අන්දමට සැදැහැවතුන් වෙත ගෙන යන බලවත් උපකරණයකි.

මෙම ග්‍රන්ථයේ ප්‍රධාන අරමුණු වුයේ දේව වචනයෙන් ජනතාව පෝෂණය කිරීමයි. එය හුදෙක් දැනුමට පමණක් සීමා වුවක් නොවේ. මෙම ග්‍රන්ථයට ජේද 2685 කි.

ඉදිරිපත් කිරීම -
අලගොල්ලෑව සා. අන්තෝනි මහ විදුහලේ
ගුරු ඩේමියන් පෙරේරා පියතුමා

# සිහිනය



තුෂාරට හොඳටම උණ, එයා යහනේ වැතිරිලා කණගාටුවෙන් වගේ. තද උණ ගතිය නිසා එයාව වරින් වර නින්ද තුරුල් කර ගත්තා. මේ නිදා ඉන්න අතරේ එයා අමුතු හීනයක් දුටුවා. එක හරි පුදුම හීනයක්.

තුෂාර ගඟ අසල ඇවිදිමින් සිටින අතර එයාට ගඟට බැහැල බලන්න හිතුනා. සීතල ගතිය ඇගට දැනුණා. එක පාරටම ගඟට පැන නාන්න පටන් ගත්තා. "මටත් මාලුවෙක් වගේ පීනන් ඇත් නම් කොච්චර හොඳ ද කියලා තමාටම කියා ගත්තා." ඒ වචනය කියනවාත් එක්කම වාගේ විශාල මිනිහෙක් දියෙන් මතුවුණා. මූන පුරාම සුදු රැවුලක් තිබුණා. පාට පාට කොරල වලින් වැසුණු දිග තොප්පියක් දාගෙනයි ඒ මිනිහ හිටියේ. ඇඟ පුරාම "ලස්සන වයිරං වයිරං පාට, පාට පාට කෙඳි වලින් වියන ලද ගෝනියක් කරේ එල්ල ගෙන තුෂාර ඉදිරියට ඇවිත් "ඔබගේ ඉල්ලීම පරිදි රතු ලූලෙක් වීමට තාවකාලික පත්වීමක් දෙනවායි කීවා." ඒ කියන කොටම තුෂාර ගේ ඇඟ පුරාම රතුපාට වරල් සහ කොරල ඇති වුණා. දිය යට පීනා ගෙන ඇතට ගිය මේ රතු ලූලා හෙවත් තුෂාරට හරි ප්‍රීතියක් ඇති වුණා.

ගල් පර අස්සෙන් පීනුවා තව මාලු රංචු එක්ක පීනුවා. කොච්චර ලස්සනද මේ රතු ලූලාගේ සතුට කෙලවරක් නෑ. මෙහෙම ඉන්න අතරතුරේ මේ රතු ලූලා හෙවත් තුෂාරට බඩගිනි දැනුණා. එන්න එන්න බඩගින්න වැඩි උනා. මෙහෙම ඉන්න අතරතුරේ මේ මාලුවා දැක්කා ඇමක්. මෙයා හෙමින් ඇම ළඟට කිට්ටු වෙලා වටපිට බැලුවා.

ඒක බිලිපිත්තක්. ඒ පිත්ත අල්ලන් ඉන්නෙ අපේ පියදාසනේ බොලේ කියලා මේ මාලුවා සතුටු වුණා. පියදාසට මම කියනව මේ තාවකාලික පත්වීමක් ලැබුවට මම තුෂාර කියලා. එතකොට මිනිහ මාව අතහරිවි කියලා හිතලා ඒ ඇම ගිල දම්මා. පියදාස හරි සන්තෝෂයෙන් බිලි පිත්ත ගැසුවා. කවදාවත් අහුවුනේ නෑ මේ වගේ නාම්බෙක් කියලා උඩ පැන පැන ප්‍රීති වුණා. මේ රතු ලූලා නොහොත් තුෂාර පියදාසට කියන්න පටන් ගත්තා. "පියදාස මාව අතහැරපන්" මේ තාවකාලික පත්වීමක් ලැබුවටම මම තුෂාර, මාව අතහැරපන් කියලා නැවතත් කිව්වා. අනේ අවාසනාවකට මේ කියන එකක් වත් පියදාසට තේරෙන්නේ නෑ වගේ.

පියදාස පදිංචි වෙලා ඉන්නේ තුෂාරලාගේ වත්ත පහළ ගෙදරක. ඉතින් මේ රතු ලූලට කරන්න දෙයක් නෑ. පියදාස ලූලගේ කරමලෙන් ඉරටයක් ගහලා දියයට පඳුරක හැංගුවා. ආයෙත් පියදාස ඇමක් දියට දැම්මා. මෙහෙම ටික වේලාවක් යන කොට මේ තුෂාරලගේ ක්‍රිසන්ත අයියා පියදාස ළඟට ආවා. "පියදාස අයියේ ඇල්ලුවේ නැද්ද මාළු එහෙම". මොන මාළුද මහත්තයෝ, තව එකෙක්වත් ඇල්ලුවේ නැහැ"යි කීවා. නමුත් ක්‍රිසන්ත අයියා හිනාවෙලා " මම දන්නවා ඔය බොරු කියන්නේ කියලා" වෙනදා මාලු අල්ලා හංගන තැන බැලුවා." ජේනවා නේද කියපු බොරුව කියා අර පඳුර අස්සේ ගසා තිබුණු රතු ලූලාව ඇදගෙන ගෙදර දිව්වා.




මේ දුවන අතරෙදි රතු ලූලා නොහොත් තුෂාර ඒ ගොල්ලන්ගේ අයියාට කිව්වා "මම තුෂාර තාවකාලික පත්වීමක් ලැබුවට මම තුෂාර මා අඳුනගන්න බැරි වුණාට මම තුෂාර කියලා" අනේ අවාසනාවකට මේ කියන එකක්වත් ක්‍රිසන්ත අයියාට ඇහෙන්නේ නැහැ වගේ, එයාට ගානක්වත් නෑ වගේ එයා ගෙදර දිව්වා.

ක්‍රිසන්ත අයියා ගෙදර ගිහින් මෙන්න අලි රතු ලූලෙක් ඇල්ලුවා පියදාස. අපි ගමු මුව උයන්න කියලා කීවා. කුස්සියේ ඉන්න නැන්දා ඒ ලොකු රතු ලූලා දිහා බලලා අද රෑට හොඳ හොද්දක් හදතැකි කියා, රතු ලූලව අර ගෙන කුස්සිය පැත්තට ගියා. මොනවා කරන්නද කරන්න දෙයක් නැහැ. මේ රතු ලූලා "නැන්දට කියන්න පටන් ගත්තා මේ තාවකාලික පත්වීමක් ගත්තට මම තුෂාර. මාව අඳුනන්න බැරුවාට මම තුෂාර" කියලා කිව්වා.

නමුත් මේ කීව එකක්වත් නැන්දාට ඇසුණේ නෑ වගේ එයා එයාගේ පාඩුවේ මේ රතු ලූලාව ඉරටෙන් ගලෝල ලෑල්ලක් උඩ තිබ්බා. ගෙදර තිබ්ච්ච පිහිය අරගෙන මේ රතු ලූල නොහොත් තුෂාරගේ බෙල්ලට කෙටුවා.

කොටන කොටම නිදා ඉන්න තුෂාර ඇහැරුනා ඇඟ පුරාම ඩහදිය ආලා. දැක්ක හීනේ ගැන කල්පනා කළා. ඇත්ත හීනයක් වගේමයි. කියාලා තමාටම කියා ගත්තා.

එතකොටම වගේ ඒ ගොල්ලන්ගේ අම්මා ඇවිල්ලා නළලට අත තියලා බැලුවා. උණ නම් බිඳක්වත් නැහැ. මචේචර ඉක්මනට උණ බැහැලා. ඉතින් තුෂාර තමා දැක්ක පුදුම හිනේ අම්මාට කියන්න පටන් ගත්තා. ඒක අහල අම්මත් හොඳටම පුදුම වුණා. මේ කතාව ආහපු ක්‍රිසන්ත අයියාත් පියදාසත් තුෂාරව බලන්න ආවා. මාලුවා අල්ලන කොට උගේ කට හෙල්ලෙනවා මම හොඳටම දැක්කා. නමුත් මම ගනන්ගත්තේ නැහැයි පියදාසකිව්වා. මම අරන් එන කොටත් කට හොල්ලනවා මට හොඳට මතකයි කියා ක්‍රිසන්ත අයියා කීවා. ඒ වනවිට නැන්දා කුස්සියේ උයමින් සිටියා. හරි පුදුම හීනයක් කියලා ඔක්කෝම කිව්වා.

**රූපස් ඔගස්ටින් පෙරේරා**

ප්‍රමාණ ප්‍රදීපය

වසරක් ගෙවී නව වසරක උදාව සියලු රටවල ජනතාව මහත් උත්සවශ්‍රීයෙන් සමරති. විවිධ සංස්කෘතික උරුමයන්ට අනුකූලව අලුත් අවුරුදු සිරිත් විරිත් ද විවිධ වෙස් ගනී.

මැක්සිකෝවේ ජනතාව අලුත් අවුරුද්ද එළඹෙන රාත්‍රියේදී ඊට යුහුසුළුව ලක ලෑස්ති වෙති. අලුත් අවුරුද්ද සඳහා නිවාස අලංකාර කිරීමේදී රතු පැහැයට ප්‍රමුඛතාවයක් ලබා දෙන්නේ ජීවන මාර්ගයේ දියුණුව සහ ප්‍රේමය වැඩි වර්ධනය කර ගැනීමටය. කහ පැහැය රැකියාවේ තත්වය වැඩි දියුණු කර ගැනීමට හේතු වෙතැයි සිතන ඔවුහු කොළ පැහැය ආර්ථික දුෂ්කරතා ජය ගැනීමට සමත් බැව් සිතති. සුදු පැහැය ශරීර සෞඛ්‍ය වැඩි දියුණුවට මං පාදයි.



ඩෙන්මාර්කයේ කැඩී බිඳී ගිය පිඟන් කෝප්ප දමා ඇති අයුරු

# රට රටවල අලුත් අවු

මැක්සිකෝ ජනතාව අලුත් අවුරුද්දට පැණි රස පාන් පුළුස්සා ගැනීමේදී ඒ තුළට කාසියක් දමන අතර පෙති කපා අනුභවයට ගැනීමේදී එය ලැබෙන අයට අලුත් අවුරුද්දේ සෞභාග්‍ය උදාවන බැව් විශ්වාස කැරේ. තවත් සිරිතක් නම් වසරේ සියලු නරක පුරුදු - අයහපත් ක්‍රියා කොළයක සටහන් කර මධ්‍යම රාත්‍රිය එළැඹීමට පෙර ගින්නට දමා පුළුස්සනු ලැබීමයි.

දකුණු ඇමෙරිකාවේ සිට ඇමෙරිකා එක්සත් ජනපදය වෙත පැමිණ බලද්දී අලුත් අවුරුද්දේ දී ඉහළ ස්ථානයක සිට පහතට බෝල හෙළීමේ අපූරු චාරිත්‍රයක් පවතී. පරණ



ජර්මනියේ මෝල්ට් තලපය සීතල වතුරට දමන අයුරු

අවුරුද්දේ අයහපත් සියලු දෑ ඉවත හෙළීමේ අරමුණින් මේ චාරිත්‍රය ඇරඹූ බව කියැවේ. 1907 සිට නිව්යෝර්ක් නුවර සුප්‍රකට ටයිම්ස් චතුරස්‍රයේ සිට ටයිම්ස් බෝලය පහතට හෙළනු ලැබීම අදටත් සිදුවේ. රාත්තල් 11, 875 හෙවත් කිලෝ ග්‍රෑම් 5386 ක් බරැති වෝටර් ෆෝඩ් ක්‍රිස්ටල් බෝලය බිමට හෙළීම අද ඉතාමත් ජනප්‍රිය සිරිත වී තිබේ. මෙය ටයිම්ස් චතුරස්‍රයට වඩා ඉහළින් ඇති අතර දෙසැම්බර් 31 වැනිදා රාත්‍රී 11. 59 ට මෙය හෙළීමට පෙර ගෙවෙන තත්පර ගණනය කරන අතර අවසාන තත්පර 10 ප්‍රේක්ෂකයෝ ගණනය කරති. මේ අතර විවිධ කිතුනු නිකායයන් පරණ අවුරුද්දේ රාත්‍රිය පුරා සර්ව රාත්‍රික යැදුම් මෙහෙයයන් පවත්වමින් ජනතාව ආධ්‍යාත්මික ශක්තියෙන් ඈද බැඳ තබා ගන්නටද වෑයම් කරනු දැක ගත හැකිය.

ඩෙන්මාර්කයේ අලුත් අවුරුද්දේ දී කා බී නටා ප්‍රීති සංතෝෂ වන අතර ගෙවී ගිය වසර පුරා කැඩී බිඳී ගිය පිඟන් කෝප්ප සිය හිතවතුන්ගේ නිවෙස් වල දොරටු අසල තබා යෑමේ සිරිතක් පවතී, යම් නිවෙසක අලුත් අවුරුදුදා කැඩී බිඳී ගිය පිඟන් කෝප්ප විශාල ප්‍රමාණයක් ඇත්නම් ඔහුට මිතුරු මිතුරියන් රැසක් සිටින බවට ඉඟි කෙරේ.

දකුණු අප්‍රිකාවේ අලුත් අවුරුද්ද උදාවනුයේ නොනවත්වා නැගෙන සීනු හඬ මධ්‍යයේය. අප්‍රිකාවට ආවේනික විචිත්‍ර වෛවර්ණ ඇඳුමින් සැරසී මංමාවත් දිගේ බෙර වයමින්, නටමින් ප්‍රීති වනු එහි සුලබ දර්ශනයකි.

ගිණිකෙළි සංදර්ශන අවුරුදු සිරිත් අතර බහුලය



ඉතා දිළිඳු අප්‍රිකාන රාජ්‍යයක් වන ස්වාසිලන්තයේ අස්වනු මංගල්‍යය හා සමගාමීව වර්ෂාවසාන අලුත් අවුරුද්ද සැමරේ. ස්වාසිලන්තයේ රජතුමාට සුබ පැතීමට ජනතාව පොදිකනු දක්නට ලැබෙනුයේ නව වසරේ සශ්‍රීකත්වයට එය හේතුවක් වන බවට විශ්වාසයක් ඔවුන් අතර පවතින නිසාවෙනි.

ග්‍රීසියේ ජනවාරි 01 දා වසරේ පළමු දිනය මෙන්ම සාන්ත බැසිල් තුමාගේ මංගල්‍ය දිනයයි. විශේෂ අලුත් අවුරුදු පාන් නිපදවනු ලබන්නේ කාසියක් ඒ තුළට දැමීමෙනි. පළමු පාන් පෙත්ත ජේසු බිළිඳුන්ටය. දෙවැන්න පවුලේ පියාට වන අතර තෙවැන්න නිවසටය. යම් හෙයකින් තෙවන පාන්



පඹයකු පුළුස්සන්නට සැරසෙන්නේ ඉක්වදෝරයේදීය

# රුදු සිරිත් විරිත්

කිතුනු උරුමය



මිදි ගෙඩි 12 ක් අනුභව කරන්නේ පේරු රාජ්‍යයේය.

පෙත්තේ කාසිය සැඟවී තිබුණහොත් වසන්ත සමය ඒ වසරේ ඉක්මනින් ම එළඹෙනු ඇතැයි ග්‍රීක ජනතාව විශ්වාස කරති.

පේරු රාජ්‍යයේ ජනතාව අලුත් අවුරුද්ද පිළිගන්නේ මිදි ගෙඩි දොළහක් අනුභව කරමිනි. 13 වැනි මිදි ගෙඩිය පේරු ජනතාවට අනුව වාසනාව උදා කරන්නකි.

පෝලන්තයේ පූර්ව අවුරුදු සන්ධ්‍යාව සාන්ත සිල්වෙස්ටර් මුනිඳුගේ සන්ධ්‍යාව ලෙසින් සමරනු ලැබේ. මේ සාන්තුවරයා අතිඋත්තම පළමුවන සිල්වෙස්ටර් ශුද්ධෝත්තම පියතුමා වන අතර වසර එක්දහසේ ජනවාරි 01 දා මකරකු මෙල්ල කර ජනතාව මුදා ගැනීම නිසා මේ දිනය යොදා ගෙන තිබේ.

නෝර්වේ රටේ වෙසෙන නෝර්වීජියානුවන් අලුත් අවුරුද්දට බත් පුඩිමක් සකස් කර ඒ තුළ ආමන්ඩ් ඇටයක් සඟවනු ලැබේ. මේ වාසනාවන්ත ආමන්ඩ් ඇටය ලැබෙන තැනැත්තාට උදාවූ වසර පුරා වාසනාව උදාවනු ඇතැයි ඔවුහු විශ්වාස කරති.

ජර්මන් වැසියෝ මෝල්ට් තලපයක් සීතල වතුරට එක් කරන අතර එහිදී එයින් හැදෙන හැඩය අනුව වසරේ ක්‍රියාකාරකම් තීරණය කරති. යම් හෙයකින් හදවතක් හෝ මුද්දක හැඩයක් ඇති වුයේ නම් විවාහ මංගලෝත්සවයක්ද, නෞකාවක හැඩය හැදුනේ නම් දුර ගමනක්ද, ඌරකුගේ හැඩය ඇති වුයේ නම් වසර පුරා අඩුවකින් තොරව ආහාර පාන ද ලැබෙන බැව් ඔවුහු විශ්වාස කරති.

අයිස්ලන්තයේ අලුත් අවුරුද්දට බොන් රතිඤ්ඤා නැතිවම බැරි අංගයකි. දෙසැම්බර් 31 වැනිදා මධ්‍යම රාත්‍රී දිව්‍ය පූජාවෙන් පසු වීදි පුරා නටමින් ගයමින් රතිඤ්ඤා පත්තු කරමින් ප්‍රීති සන්තෝෂ වීමට අයිස්ලන්ත වැසියෝ මැලි නොවෙති.




ගෙවුණු වසරේ දුර්වලකම් ලියූ කොළ පුළුස්සමින් මැක්සිකෝවේ

කොස්ටාරිකාවේ දෙසැම්බර් 31 දා රාත්‍රී 9 වන විට ඇරඹෙන ප්‍රිය සම්භාෂණය අළුයම දක්වා පැවැත්වේ. අලුත් අවුරුද්ද එළඹීමත් සමගම. මං මාවත් දිගේ බඩු පොදියක් ඇදගෙන යමින් නව සංචාර හා අරුම පුදුම වාසනාවන් උදාවන්නැයි ඔවුහු ප්‍රාර්ථනා කරති.

ඉක්වදෝරයේ අලුත් අවුරුදු උදාවත් සමග මංමාවත් වල සිය දහස් ගණන් පඹයන් පුළුස්සා දමන අන්දම දැක ගන්නට හැකිය. ගෙවී ගිය වසරේ අතපසුවීම්, අඩුපාඩු හා දුර්වලතා ගිනි තබා විනාශ කර නව බලාපොරොත්තුවකින් නව වසරකට පිවිසීම මෙහි අරමුණයි.

ශිරාන් මෛත්‍රී

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 36

**Somebody -** (සම්බොඩි කියන්නෙ කව්දෝ කෙනෙක්.
**Someone -** සම්වන් කියන්නෙත් ඒකමයි.

***somebody*** has come to see you (සම්බොඩි හැස් කම් ටු සී යූ)
කව්ද ඔබව හම්බවෙන්න ඇවිල්ල.

***someone*** has torn my book. (සම්වන් හැස් ටෝන් මයි බුක්)
කව්දෝ මගෙ පොත ඉරල.

***somebody*** should go with him. (සම්බොඩි ෂුඩ් ගෝ විත් හිම්)
ඔහු සමඟ කව්රු හරි යා යුතුයි.

***someone*** is waiting near the door.
(සම්වන් ඉස් වෙයිටින්ග් නියර් ද ඩෝ(ර්)
කව්ද කෙනෙක් දොර ළඟ ඉන්නවා.

**Something** (සම්තිං) - කියන්නෙ යම් දෙයක්
I am hungry, I want ***something*** to eat
(අයි ඇම් හන්ග්‍රි, අයි වෝන්ට් සම්තිං ටු ඊට්)
මට බඩගිනියි, මට මොනවහරි කන්න ඕනා.

***something*** is wrong with my car, It doesnt't start.
(සම්තිං ඉස් රෝං විත් මයි කා(ර්) ඉට් ඩසන්ට් ස්ටා(ර්)ට්)
මගෙ කාරෙක ස්ටාට් වෙන්නෙ නෑ. මොකක් හරි වරදක් තියෙනවා.

I have to buy ***something*** for Nimal's birthday.
අයි හැව් ටු බයි සම්තිං ෆො(ර්) නිමල්ස් බර්ත් ඩේ)
නිමල්ගෙ උපන්දිනේට මොකක් හරි තෑග්ගක් ගන්න ඕන.

***Some people*** are very kind. (සම් පීපල් ආ(ර්) වෙරි කයින්ඩ්)
සමහර මිනිස්සු හරි කරුණාවන්තයි.

***Some of the boys*** who came to the party are my classmates.
(සම් ඔෆ් ද බෝයිස් හු කේම් ටූ ද පා(ර්)ටි ආ(ර්) මයි ක්ලාස්මේට්ස්)
පාටියට ආපු සමහර පිරිමි ළමයි මගෙ පන්තියෙ අය.

**'Some'** කියන එකේ තේරුම, ටිකක්, සමහරක් වැනි අදහසක් වුනාට, "කව්දෝ" කියන සිංහල අදහස ප්‍රකාශ කිරීමටත් යොදා ගන්නවා. "එක්කෙනෙක්", "කව්දෝ හොරෙක්", "කව්ද මෝඩයෙක්" වැනි යෙදුම් වලටත් **'some'** යොදනවා - මේ විදිහට:

***Some fool*** has spilt my cup of tea.
(සම් ෆූල් හැස් ස්පිල්ට් මයි කප් ඔෆ් ටී)
කව්දෝ මෝඩයෙක් මගේ තේ එක හලලා.

***Some thief*** has stolen her necklace.
(සම් තීෆ් හැස් ස්ටෝලන් හ(ර්) නෙක්ලස්)
කව්ද හොරෙක් ඇයගේ මාලෙ හොරකම් කරලා

***Some foreigner*** has bought his car.
(සම් ෆොරින(ර්) හැස් බෝට් හිස් කා(ර්))
කව්ද පිටරැටියෙක් ඔහුගෙ කාරෙක මිලදී අරගෙන.

<u>"කව්ද නොදන්න අය වගයක්" කියන අදහසටත් **some** යෙදෙනෙවා.</u>

***Some girls*** came to ask for donations.
කව්දෝ ගෑණු ළමයි වගයක්, ආධාර ඉල්ලමින් ආවා.
"අප්‍රානික දෙයක්" පිළිබඳවත් **some** යෙදෙනවා.

He looks sad. ***Some problem*** is worrying him.
(හී ලුක්ස් සෑඩ්. සම් ප්‍රොබ්ලම් ඉස් වොරිං හිම්)
ඔහු දුකෙන් වගේ ඉන්නෙ. මොකක් හරි ගැටළුවක් ඔහුව කරදරයට පත් කරනවා.

I had ten books. But now I have nine. ***Some book*** is missing.
(අයි හැඩ් ටෙන් බුක්ස්. බට් නව් අයි හැව් නයින්, සම් බුක් ඉස් මිසින්ග්)
මට පොත් දහයක් තිබුණා. දැන් තියෙන්නෙ නවයයි. මොකක් හරි පොතක් අඩුයි.

# දෙව්ඳු තිළිණය

මේ මුළු ලෝකයේ ඔබ මට
දෙව්ඳු තිළිණයකි
අම්මේ.....
මැණියනී ඔබ මහා හිම කන්දක් නම්
මම එහි සිරවී සිටින
කුඩා හිම වලස් පැටවෙක් වෙමි
මගෙ මුළු ජීවිතේ ඔබ දුන් දිරිය
මාගේ පරාජයේ ජයග්‍රහණය විය.

දහසය හැවරිදි විය පසු කරත්ම
ඔබේ ආදරේ දැනෙයි මා හට
කුඩා දිවිය තුළ ඔබ දුන් හුස්මට
ණය ගැතියි අම්මේ මා සදහට
පොඩි දූ කියා අමතන ආදර ඇමතුම
ඇසෙයි මා වට පිළිරුව් දී එය

මගේ දිවියේ බලාපොරොත්තුව
ළගා කර දුන් ඔබයි ජය කණුව
ජයග්‍රහණයේ සතුට විඳිනට
ඔබයි මා ළග සිටියෙ සැම දින
දිවියේ කෙළවර තුරා ඔබ සමඟ
සිටිමි මා ඔබෙ පුංචි දියණිය

**නෙත්මි චාරුන්ද්‍යා ඩයස්**
**11 ශ්‍රේණිය, සා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ**



**2011 වර්ෂයේ පැවැත්වූ ලේඛන වැඩමුළුවන්හිදී ලබා දුන් අභ්‍යාසවලින් ජයග්‍රාහී නිර්මාණයන් නොවූවද ප්‍රශස්ත මට්ටමේ පැවැති නිර්මාණයන්.**

# සදා ණය ගැතියි !

වන්නට ඇත තවත් එක් වසරක
කුමරි මරියාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල දිනය
එදින මා වාසනාවන්ත මැණියන් බිහි කළා
තවත් එක් ඇගේම ආදරයේ මිණි පහනක්,
ඒ අන් කවරෙකුත් නොව මාය
අම්මේ එදා සිට අද දක්වා
ඔබේ ආදරය තුළ පොහෝණි වූ
සැටි මා මෙලෙස පන්හිඳෙන් කියන්නම්
අඳුරු අහස් කුස එළිය කරනා
සුපුන් සඳක් සේ
ඔබ මා හට ආලෝකය වුවා මැණියේ,
ඒ අමරණීය ආලෝකය තුළ වුවා
මම යහපත් දියණියක්
විටෙක මා පාළු වැලිකතරක
තනිවෙමින් හඬන්නට ඇත
එනමුදු ඒ සැමවිටම වැලි කතරට
හාම එන මඳ සුළඟේ
ඔබ විත් මා සොඳුරු ලොවකට
රැගෙන ගියා
ජීවිතයේ මා ලද සැම ජයක් පසුපසම
ඔබයි, අම්මේ ඒ මහගු ශක්තිය.

**හිමාෂා හර්ෂණී,**
**11 ශ්‍රේණිය,**
**ජාකෝමේ ගොන්සාල්වෙස් දහම් පාසල, බෝලවත්ත.**

# සෙනෙහසේ කඳුළු බිඳු

තෙරක් නොපෙනෙන මහ සයුරෙන් වෙන්ව - හිම කතරේ තනිව දුක් විඳිනා ඔබ
හෙළනා දා බිදු සියල්ලක්ම - අප නිසා නොවෙද මගෙ සුදු තාත්තේ...
හුදෙකලා වී කෙම්බිමේ - නීරස විඳින ඔබ
අපේ හඬ සවන් ලු කෙනෙහිම - සතුටු කඳුළු හෙලනවා නොවෙද තාත්තේ...
තෙරක් නොපෙනෙන සාගරයෙන් වෙන් වුවද
ඔබෙ සෙනෙහස වෙන් නොවේ මගේ තාත්තේ..
අමයුරු පරදන ඔබේ වදන් පෙළ - මට අමරස දෙයි ආදර තාත්තේ...
කාසි මල්ලට යට නොවූ ඔබේ සෙනෙහස
මට දැනෙනා හැම මොහොතකම - හදවත රිදුම් දෙනවා තාත්තේ....
සිතකය වැළකළ ඔබෙ කැපවීමට
මා සදා ණය ගැතිවෙමි රත්තරන් තාත්තේ... - දෙවියන් බඳුවූ මගේ තාත්තාට
මං ආදරෙයි මගෙ සුදු තාත්තේ...
ඔබ සිහි කරනා මොහොතක් පාසාම - තනි වී වෙන් වී ඔබේම ලොකු දුව
සෙනෙහෙන් මොදුවූ කඳුළු හෙලනවා - දන්නවාද මගෙ රත්තරන් තාත්තේ ?

**සුපුනි මාධවී ප්‍රනාන්දු - 11 ශ්‍රේණිය, සා. මරියා දහම් පාසල, නයිනමඩම.**



## අපේ ගැලවුම්කරුවාණෝ




**ගයාන් ප්‍රදීප්**
10 ශ්‍රේණිය,
සා. ඉසිදෝරු දහම් පාසල,
තිබ්බොටුගොඩ.

පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## දිව බොදුනින් පෝෂණය වෙමු



**ශෙනන් හිරුෂික ප්‍රනාන්දු**
2 ශ්‍රේණිය,
සා. මිඛායෙල් දහම් පාසල,
කොරළවැල්ල.

## මරිය තුමිය




**අමායා කෞශල්‍යා රුද්‍රිගු**
සමනළ උයන පෙර පාසල
බොරලැස්ගමුව.

## දිනයක ඇරඹුම




**දෙව්මිණි චවීෂා**
2 ශ්‍රේණිය,
සෙනරත් කනිෂ්ට විද්‍යාලය
මිදෙල්ලවිට.

## නෝවා සහ ජල ගැල්ම



**මරේෂා දිල්යානා**
2 ශ්‍රේණිය,
ආවේ මරියා බාලිකා විදුහල
මීගමුව.

## අපේ ගෙවත්ත



**වී.ඒ. රශ්මි හිරන්**
3 ශ්‍රේණිය,
සා. මරියා දහම් පාසල, මතුගම.

## දිය ඇල්ලක්




**සඳුනිකා තරුමිණි**
8 ශ්‍රේණිය,
සා. මරියා දහම් පාසල,
නයිනමඩම.

## සුන්දර ගම්මානයක්



**ෆාතිමා රුෂ්ඩා ෆහ්මි**
9 ශ්‍රේණිය, සියළු සාන්තුවරයන්ගේ බාලිකා මහා. විද්‍යාලය, බොරැල්ල.

## දෙවි පියා මැවූ ලොවෙහි සුන්දරත්වය



**රජිතා මධුෂානි ප්‍රනාන්දු**
5 ශ්‍රේණිය,
සා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල,
හලාවත

# සුදතුම් වරම් ලැබීම





## කුරුණෑගල පදවිය

2012 වසරේ යෙදෙන 125 වන ජයන්තියට සමගාමීව පන්නල සා. ඇග්නස් දේවස්ථානයේ ළමුන් 110 දෙනෙකු පසුගිය දා සුදතුම් වරම් ලැබීය. කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය සිදු කෙරෙනි. අභිවෘද්ධි ආලේපය ලැබූ ළමුන් රදගුරු හිමිපාණන්, මීසම් සේවක ගරු පැට්‍රික් ජයකොඩි පියතුමන් සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **එන්.ඒ.ඩී. බැසිල් ඇන්තනි**



## රත්නපුර පදවිය




බුලත්කොහුපිටිය සා. සෙබස්තියන් දෙව් මැදුරේ දී ළමුන් 29 දෙනෙකු පසුගිය දා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙය දෙහිගහපිටිය මීසම් සේවක ගරු ජූඩ් අමිල ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් හා බුලත්කොහුපිටිය මීසම් සේවක ගරු සතිස් සවරිමුත්තු පියතුමාගේ සහභාගීත්වයෙන් පැවැත්වුනි. මේ අවස්ථාවට යටියන්තොට ගරු ජුලියට් පැව්දි සොයුරියද එක් වූවාය. දිව බොදුන් ලැබූ ළමුන් පියතුමන්ලා දහම් පාසල් ගුරුවර ගුරුවරියන් සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **( ට්‍රීෂා රෝෂිණී )**

## බදුල්ල පදවිය

බණ්ඩාරවෙල සා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ දරු දැරියෝ 32 නෙකු පසුගිය දා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දිව්‍ය පූජාව මීසම් සේවක ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු, මීසම් සහයක ගරු නිව්ටන් දේව රාජා යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

දිව්‍ය පූජාවෙන් අනතුරුව ගරු පියතුමන්ලා ළමුන් පුහුණු කළ ගුරු භවතුන්, ගරු පැවැදි සොයුරියන් දිව බොදුන් ලැබූ ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.



**මනෝජ් දිවංක, 10 ශ්‍රේණිය, සා. අන්තෝනි දහම් පාසල, බණ්ඩාරවෙල.**



මග්ගොන සාන්ත විසෙන්ති පෙර පාසලේ විසි හතර වන ළමා කුසලතා දැක්ම පසුගියදා බේරුවල ප්‍රාදේශීය සභාපති ප්‍රසන්න සංජීව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙර පාසල් ශාලාවේ දී පැවැත්වුණි. මෙදින දරු දැරියන් විසින් ඉදිරිපත් කරන ලද රංගනයක් සේයාරුවේ දැක්වේ.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



බෝපිටිය එස්.පී, ඒ. විදුමග පෙර පාසලේ ත්‍යාග ප්‍රදානොත්සවය සහ වාර්ෂික විවිධ ප්‍රසංගය පසුගිය දා පමුණුගම පර්ෂද විදුහල් ජයන්ති ශාලාවේ දී පැවැත්විනි. එදින දරු දැරියන්ගේ නැටුම්, ගැයුම්, රැසක් පැවති අතර මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. විදුහල්පති සිරි සුභාෂනි ගුරු මහත්මියගේ ප්‍රධානත්වයෙන් ප්‍රසංගය සංවිධානය කෙරිණි.




# පොල්වත්ත නිර්මල හෘදයේ දහම් පාසල



බුරුල්ලපිටිය මීසම අයත් පොල්වත්ත නිර්මල හෘදයේ දේව මෑණියන්ගේ දේවස්ථානයේ දහම් පාසල් ළමුන් විසින් පසුගියදා දේවස්ථාන භූමියේ දී පොළක් සංවිධානය කෙරිනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙ හි දිස්වේ. **සමන් සී. පෙරේරා**

# නාගොඩ ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ දහම් පාසල

පසුගියදා නාගොඩ ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ දහම් පාසලේදී පොළක් පැවැත්විනි. මෙහි අරමුණ වූයේ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානොත්සවය සඳහා මුදල් එක් රැස් කිරීමයි. නාගොඩ මීසම් සේවක ගරු රංජන් සිල්වා පියතුමන්ගේ හා දොමිනිකාන කන්‍යාරාමයේ ප්‍රධාන මව් තුමිය ඇතුළු පැවිදි සොයුරියන්ගේ හා දහම් ගුරුභවතුන්ගේ සහයෝගය හා මග පෙන්වීම හා කැපවීම යටතේ මෙය සාර්ථකව පැවත්වුණි. **නිලංගිකා රොෂානි ලිවේරා**

03 පිටුවෙන්....

විශේෂයෙන් නිවසේ පිළිගැනීමක් නොලබන දරුවාට දහම් පාසල ආදරයේ තෝතැන්නක් කළ හැකි වන්නේ දහම් ගුරුවරයාටය.

දහම් ගුරුවරයා ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙහෙයවීමට නතු වීමකි. ප්‍රසාද ස්නාපනය ලබන සෑම කිතුනුවකුටම මෙය උරුම වුවත් දහම් ගුරුවරයාට මෙය උරුම වන්නේ විශේෂාකාරයෙනි. එය මනුෂ්‍ය ආත්මයන් සදාතන ඉරණමක් වෙත යොමු කරවීමේ කැඳවීමයි. " මා නුඹ කුසෙහි පිළිසිඳීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි. ජාතීන් හට දිවැසිවරයෙකු ලෙස මම නුඹ පත් කළෙමි." (ජෙරමියා 1:5) සමහර දහම් ගුරුවරුන් තුළත් ගැඹුරු ආධ්‍යාත්මයක් නැතිකම, අසත්‍යය දේ කතා කිරීම. අනුන් හෙළා දැකීම වැනි දුර්ගුණයන්ගෙන් මිදී අන් අයගේ ජීවිත දෙස යථාර්තවාදීව එබී බලන්නේ නම් කොයි තරම් පැහැදිලි දැක්මක් ඇති වන්නේද ? "මාගේ දරුවෙනි ඔබ තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩ ගැසෙන තුරු ඔබ උදෙසා නැවතත් මම ප්‍රසව වේදනා විඳිමි" (ගලාති 4: 19) අප සතු මෙම වගකීම ඉතා භාරදූරය. එමෙන්ම ගෞරවාන්විතය. එමනිසා අප උත්ථානවූ ජේසුස් වහන්සේ දරුවන්ට හඳුන්වා දෙන අපෝස්තලික දූත කාර්යයේ අනුගාමිකයෝ වෙමු.

## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - ප්‍රවීන ඊලියන් රස්ටන්

**ශ්‍රේණිය** - 3 ශ්‍රේණිය

**දහම් පාසල** - පාතිමා දහම් පාසල බත්තරමුල්ල

**කුසලතා** - චිත්‍ර



තුඩැල්ල ක්‍රිස්තුරාජ ජාතික පාසලේ ක්‍රිස්තුරාජාණන්ගේ මංගල්‍යය විදුහල් ආදි සිසු ගරු මලින්ද චතුරංග පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. මංගල පූජා මෙහෙයෙන් අනතුරුව ක්‍රිස්තු රජාණන්ගේ ප්‍රතිමාව රැගත් විථි පෙරහැර විද්‍යාලයීය ක්‍රීඩාංගණය වටා ගමන් කළ අයුරු.


**ලෝරන්ස් ප්‍රනාන්දු**




**මෙවර කිතුනු ළමා හමුවේ රට රටවල අලුත් අවුරුදු සිරිත් විරිත් පිළිබඳව විශේෂ වැඩසටහනක් විකාශනය වේ.**

**2012 ජනවාරි 01 වන ඉරුදින ප.ව. 5.30 ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය වන මෙහි කරුණු ඉදිරිපත් කරන්නේ ඥානාර්ථප්‍රදීපය සහය සංස්කාරක ශිරාන් මෛත්‍රි මහතා විසිනි.**

## ප්‍රහේළිකා අංක 27



**හරහට**

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ............ ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලූක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**ප්‍රහේළිකා අංක 27 සඳහා පිළිතුරු ලබන සතියේ**

# අලුත් අවුරුද්ද

## අලුත් අවුරුදු චිත්‍ර කතාව

**සැකසුම : තිළිණ අලහකෝන්**




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා